සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/06/EP/01/චක්‍රලේඛ-2023
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2023.01.27

*සමෘද්ධි චක්‍රලේඛ අංක 2023./ 02*

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම මූලස්ථාන, ව්‍යාපෘති, බැංකු සමිති, ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2023</u>**

සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය තිරසාර ලෙස පවත්වාගැනීම සඳහා අලෙවි වැඩසටහන්, රැකියා අභිමුඛ විවිධ පුහුණු වැඩසටහන් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් පිරිපුන් ව්‍යවසායකයින් බිහි කරමින් මෙරට ජාතික නිෂ්පාදනය ඉහළ අගයකට ගෙන ඒමට දායකත්වය දැක්වීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 අලෙවි සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත. මෙයටතේ පහත සඳහන් වැඩසටහන් සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

1. කුඩා පරිමාණ අලෙවිසැල් පිහිටුවීම.
2. සමෘද්ධි සුව බොජුන්හල්, අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා අලෙවි පොළ සංවර්ධනය.
3. නව බොජුන්හල් ස්ථාපිත කිරීම.
4. සමෘද්ධි අභිමානී වෙළඳ ප්‍රදර්ශන.
5. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන.
6. අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවිය - Online Marketing
7. ව්‍යාපාරික සංගම් පිහිටුවීම.
8. භාෂා නිපුණතාවය ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
9. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාදීම.
10. වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන.
11. වස විසෙන් තොර ආහාර, දේශීය ආහාර පිළිබඳ පුහුණු වැඩසටහන.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

1. **කුඩා පරිමාණ අලෙවිසැල් පිහිටුවීම.**

සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවස්ථාවක් ඇති කිරීම මෙහි මූලික අරමුණ වේ. එමෙන්ම අත්‍යවශ්‍ය අවස්ථාවන් හීදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් ලබාදෙන පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම සඳහා ද මෙම අලෙවිසැල් යොදාගත හැකි වේ. තවද ජීවන වියදම ඉහළයාම නිසා පාරිභෝගිකයන් අසීරුතාවයට පත්ව සිටින මෙම කාල වකවානුවේ දී සාධාරණ මිලකට තම නිවස ආසන්නයෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදීගැනීමේ හැකියාව ඇති කිරීමටත්, සමෘද්ධි හා අඩු ආදායම්ලාභී දැනටමත් අලෙවිසැලක් පවත්වාගෙන යන හෝ ඉදිරියේ දී ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිලාභීන්ගේ අඛණ්ඩ ආදායම් වර්ධනය කිරීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මෙහිදී 2022 වර්ෂයේ දී ඔබ විසින් බැංකු කලාපයකට 01 ක් වන අයුරින් ව්‍යාපෘතිලාභීන් හඳුනාගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර 2023 වර්ෂයේ දී වසමකට 01 ක් වන ලෙස මෙම ව්‍යාපෘතිලාභීන් හඳුනාගත යුතුව ඇත. මෙම අලෙවිසැල් සඳහා විවිධ නිෂ්පාදන සිදු කරනු ලබන පෞද්ගලික ආයතන සම්බන්ධීකරණයෙන් වැඩි වට්ටම් සහිතව භාණ්ඩ හා නිෂ්පාදන ලබාදීමේ කටයුතු ඉදිරියේ දී සම්බන්ධීකරණය කර දෙනු ඇත.

2. **සමෘද්ධි සුව බොජුන්හල්, අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා අලෙවි පොළ සංවර්ධනය.**

2023 වර්ෂයට වෙන්වී ඇති ප්‍රතිපාදන ඉතා සීමිත බැවින් දැනට ක්‍රියාත්මක සුව බොජුන්හල්, අලෙවි මධ්‍යස්ථාන හා අලෙවිපොළ වල අත්‍යවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා පමණක් අවධානය යොමු කර ඒ සඳහා අදාළ ඇස්තමේන්තු සකස් කර යොමු කිරීමේ හැකියාව පවතී.

3. **නව බොජුන්හල් ස්ථාපිත කිරීම.**

2023 වසරේ දී නව ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබාදීමට නොහැකි බැවින් ඔබ ප්‍රදේශයේ පවතින, රජයට අයත් භාවිතා නොකරනු ලබන ගොඩනැගිලි තිබේනම් දීර්ඝකාලීන බදු පදනම මත ඒවා ලබාගෙන එම ස්ථාන වල සමෘද්ධි සුව බොජුන්හල් හෝ අලෙවි මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ හැකියාව පවතී. එබැවින් මේ සඳහා විභවතාවයක් පවතින සුදුසු ස්ථාන හඳුනාගෙන එම තොරතුරු ලබාදිය යුතුවේ. එමෙන්ම රජයේ ආයතන වල බොජුන් හල් ස්ථාපිත කිරීමට ඉඩ පහසුකම් පවතින ස්ථාන හඳුනාගෙන එම ආයතන සම්බන්ධීකරණය කොට එහි ආහාර නිෂ්පාදන අලෙවිය සඳහා අඩු ආදායම්ලාභී පිරිස් යොමු කිරීම යෝග්‍ය වේ.

4. **සමෘද්ධි අභිමානී වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම.**

මෙම ප්‍රදර්ශන මීට පෙර වර්ෂයන්හිදීත් ඔබ දිස්ත්‍රික්කයේ සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. සමෘද්ධි බැංකු/ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති මට්ටමින් මෙම වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම අවශ්‍ය වන අතර සිංහල හා හින්දු අළුත් අවුරුද්ද ඉලක්ක කරගෙන අප්‍රේල් මස 7-10 අතර කාල පරාසයන් හීදී පැවැත්විය යුතු වේ. සමෘද්ධි නිෂ්පාදකයන් ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට මෙය ඉතා වැදගත් වන බැවින් මේ පිළිබඳව නිෂ්පාදකයින් දැනුවත් කිරීමට මුල සිටම කටයුතු කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත බැවින් මේ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ ගැටළුවක් පවතින අතර බැංකු සමිති වල පවතින පොල අරමුදල් හා ව්‍යාපාරික සංගම් වල අරමුදල් භාවිතා කළ හැක. ප්‍රාදේශීය සංවිධාන වල මුදල් මේ සඳහා යොදාගන්නා අවස්ථාවන් හීදී එම මුදල් වැය කිරීමට පෙර ප්‍රජා මූල සංවිධාන අංශයේ අනුමැතිය ලබාගැනීම

අත්‍යවශ්‍ය වේ. තවද ප්‍රදේශයේ තිබෙන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන පෞද්ගලික ආයතනවල අනුග්‍රහය ද මේ සඳහා ලබාගැනීමේ හැකියාව පවතී.

5. **ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන.**

2022 වර්ෂයේ ක්‍රියාත්මක දිස්ත්‍රික්ක 08 හී YouLead ආයතනයේ ප්‍රතිපාදන මත අඛණ්ඩව 2023 වර්ෂයේදීත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. දැනට ක්‍රියාත්මක දිස්ත්‍රික්කවලට අමතරව ඉතිරි දිස්ත්‍රික්කයන් වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් හී තවත් වැඩසටහන් 300 ක් 2023 වර්ෂයේ දී YouLead ආයතනයේ ප්‍රතිපාදන මත පැවැත්වීමට අපේක්ෂිතය. එමෙන්ම මෙම වැඩසටහන තුලින් පුහුණුව ලැබූ කළමණාකරුවන් (TOT ) මගින් දැනට ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ට ව්‍යවසායකත්ව පුහුණුව ලබාදිය යුතු අතර, පුහුණුව ලැබීමෙන් අනතුරුව මෙම සංවර්ධන නිලධාරීන් විසින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශයේ ව්‍යවසායකයින් 100 ක් පමණ පුහුණු කිරීමටත් පුහුණුවෙන් අනතුරුව පසු විපරම් කටයුතු සිදුකිරීමක් කළ යුතු වේ.

6. **අන්තර්ජාලය හරහා භාණ්ඩ අලෙවිය - Online Marketing**

ආරම්භයේ දී කාන්තා ව්‍යවසායිකාවන්ගේ නිෂ්පාදන සඳහා අන්තර්ජාලය හරහා අලෙවි අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම මෙහිදී සිදු වේ. මේ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

7. **ව්‍යාපාරික සංගම් පිහිටුවීම.**

විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන පුද්ගලයන්ගේ නිෂ්පාදන චිරස්ථායිව පවත්වාගනිමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීමටත්, දේශීය වෙළඳපොළ ඉක්මවා යමින් ඔවුන් අපනයන වෙළඳපොළ වෙත යොමු කිරීම වැනි කාර්යයන් සඳහා නිෂ්පාදකයන්ගේ/ අලෙවිකරුවන්ගේ එකමුතුවක් අවශ්‍ය වේ. එබැවින් මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපාරික සංගම් පිහිටුවීම දැඩි අවශ්‍යතාවයක් බැවින් මේ සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් 2022.05.18 දින ඔබ වෙත එවා ඇති අතර ඒ අනුව කටයුතු කිරීම යෝග්‍ය වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවන ලද ව්‍යාපාරික සංගම් වල දිස්ත්‍රික්කයේ එකමුතුවක් ද ඇති කළ යුතු අතර මේ සඳහා Whatsapp සහ මුහුණු පොත (Face book) භාවිතා කළ හැක.

ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය, කුඩා ව්‍යාපාර අංශය වැනි ආයතන සම්බන්ධ කරගෙන මෙම ව්‍යාපාරික සංගම් හා සම්බන්ධීකරණය කිරීම ප්‍රජා මූල බැංකු සමිතියේ කාර්ය භාරයක් වේ.

8. **භාෂා නිපුණතාවය ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.**

සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂා ප්‍රවීනතාවය හා වෘත්තීය කුසලතා ලබාදීමට පහසුකම් සැලසීමේ වැඩසටහන් 07 ක් මේ වන විට ආරම්භ කර ඇත. වර්තමානයේ උද්ගතව ඇති රැකියා අර්බුදය හේතුවෙන් රැකියා වියුක්ත තරුණ තරුණියන් සඳහා විදේශ රැකියා අවස්ථා සඳහා ඉල්ලුම් කිරීමට එම රටවල භාවිතා වන භාෂාවන් දැනසිටීම අත්‍යවශ්‍ය වේ. භාෂා නිපුනතාවය හා වෘත්තීය පුහුණුව සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉලක්කගත තරුණ තරුණියන් හඳුනාගැනීම සහ පුහුණු වැඩසටහන් සඳහා අදාළ භාෂා ප්‍රවීනතාවය ලත් ගුරු භවතුන් සම්බන්ධීකරණය හා වෘත්තීය

නිපුණතාවය ලබාදීමට මෙම පිරිස යොමු කිරීම ආදී කටයුතු කළ යුතු වේ. ජපන් භාෂා ප්‍රවීණතාවයේදී N 5සහ N 4 මට්ටමේ විභාගය සඳහා දිවයින පුරා තරුණ තරුණියන් 2500 ක් පුහුණු කිරීමට නියමිත අතර විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සේවා ආයතනය සමග ඒකාබද්ධව මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

**9. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාදීම.**

සමෘද්ධි හා අඩු ආදායම්ලාභී විවිධ නිෂ්පාදනයන් සිදු කරනු ලබන ව්‍යාපාතිලාභීන්ගේ නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ දී අනෙකුත් නිෂ්පාදන සමග තරඟ කිරීමට නම් එහි ගුණාත්මක තත්ත්වය ඉහළ තලයක පැවතිය යුතු අතර ඒ සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබාගත යුතුව ඇත.

මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව සමෘද්ධි නිෂ්පාදකයින්ගේ භාණ්ඩ හා සේවා සඳහා තත්ත්ව හා ප්‍රමිති සහතික ලබාදීමට සැලසුම් කර ඇත. මේ සඳහා ඉදිරියේ දී කටයුතු සිදු කළ යුතු බැවින් දැනට ඔබ දිස්ත්‍රික්කයේ නිෂ්පාදන හා සේවා පිළිබඳව තොරතුරු රැස්කර තබා ගැනීම අවශ්‍ය වනු ඇත. එමෙන්ම ව්‍යාපෘති කළමණාකරු විසින් තම ප්‍රදේශයේ නිෂ්පාදකයින් 10 දෙනෙකු සඳහාවත් ගුණාත්මක නිෂ්පාදන ක්‍රම (GMP – Good Manufacturing Practice) සහතිකය ලබා දීමට කටයුතු කළ යුතු වේ. www.slsi.lk වෙබ් අඩවියෙන් සියළු තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත.

**10. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන.**

පාසැල් අධ්‍යාපනය අවසන් කළ (අ.පො.ස. සා.පෙ. /උ.පෙ.) තරුණ දූ දරුවන් සඳහා ඉදිරියේ දී ඔවුන්ට යොමු විය හැකි රැකියා අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම මෙහිදී සිදු වේ. දැනටමත් නියමු ව්‍යාපෘතියක් ලෙස ගම්පහ සහ මුලතිව් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසටහන ආරම්භ කර ඇති අතර එම අත්දැකීම් උපයෝගී කරගන ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් ඔබ වෙත ලබාදෙනු ඇත. ඉලක්කගත තරුණ තරුණියන් සඳහා අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් සංවර්ධන නිලධාරි හා නිපුණතා සංවර්ධන නිලධාරී මෙහි දී විශේෂයෙන්ම සම්බන්ධ කරගත හැකි වේ. අ.පො.ස (උසස් පෙල) විභාගය අවසන් වීමෙන් පසුව මාර්තු 13-16 අතර කාලයේදි සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම තරුණ තරුණියන් 50 ක් පමණ සම්බන්ධ කරගෙන අවම වශයෙන් වැඩසටහන් 01 ක් හෝ පැවැත්විය යුතුය. මෙහිදී එක වසමකින් 2 දෙනෙකුවත් සම්බන්ධ කළ යුතු වේ. ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය අලෙවි අංශය වෙත ලබා දිය යුතු අතර ඒ සඳහා Google Sheet ඉදිරියේ දී හඳුන්වා දෙනු ඇත. තවද වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු ආයතනය වෙත තරුණ තරුණියන් යොමු කිරීම හා අදාල පසු විපරම් කටයුතු සිදුකිරීම අත්‍යවශ වේ.

**11. වස විසෙන් තොර ආහාර, දේශීය ආහාර පිළිබඳ පුහුණු වැඩසටහන.**

සමෘද්ධි සුව බොජුන් හල් වල අලෙවි කටයුතු කරනු ලබන කාන්තා ව්‍යවසායකයින් ඉලක්ක කරගෙන පසුගිය වර්ෂයන් හී මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මෙම පුහුණු වැඩසටහනට අමතරව දැනට ගම්වල මෙම නිෂ්පාදන කරන පිරිස් හා සුබ සාධක සංගම්/ ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ආපනශාලා වල දැනට මෙම නිෂ්පාදන කරනු ලබන ව්‍යවසායිකාවන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ අවස්ථාව ද

පවති. ඉතා ඉහළ මට්ටමකින් නිෂ්පාදන සිදු කරනු ලබන ව්‍යවසායිකාවන් මෙම පුහුණු වැඩසටහන් වල සම්පත්දායකයින් ලෙස යොදා ගැනීම ද යෝග්‍ය වේ.

තවද සමෘද්ධි ප්‍රජා මූල බැංකු බල ප්‍රදේශය තුළ දිවයිනේ විවිධ සංස්කෘතික හා ආගමික උත්සව මුල් කරගෙන දේශීය ආහාර වර්ග නිෂ්පාදනය හා අලෙවිය සිදු කිරීමට සුදුසු ව්‍යවසායකයින් හඳුනා ගැනීම කළ හැකි වේ. මෙහි දී මොවුන් අතුරින්ම දක්ෂ නිෂ්පාදන හැකියාවක් සහිත කාන්තාවන් හඳුනාගෙන ඔවුන් මගින් අනෙක් නිෂ්පාදකයින් සඳහා පුහුණුව ලබාදිය හැක.

**පොදු උපදෙස්**

01. ඉහත දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විභවතාවයක් පවතින ව්‍යාපෘති හඳුනාගැනීමටත්, පුහුණුලාභීන් තෝරාගැනීමටත් කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

02. තෝරාගනු ලබන ප්‍රතිලාභීන් සියළු දෙනා ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විය යුතුය.

03. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් කටයුතු කළ යුතු වේ.

04. අවශ්‍ය අවස්ථාවල දී ප්‍රතිලාභීන් සමග ගිවිසුම්ගත වී ව්‍යාපෘතිය ආරම්භ කිරීම අවශ්‍ය වනු ඇත.

05. ලබාදෙනු ලබන මුදල් 2023 වර්ෂය තුළ යොදවා අවසන් කළ යුතු අතර විශේෂයෙන් ඉදිකිරීම් වලදී ව්‍යාපෘතිය අවිච්ඡේද නොකළ යුතු වේ.

06. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමනාකරු, ප්‍රජා මූල බැංකු කළමනාකරු හා ප්‍රජා මූල සමිති නිලධාරීන් රැස්වී කොට්ඨාශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති, සාර්ථකව නියමිත අරමුණු කරා යන්නේ ද පිළිබඳව සාකච්ඡා කිරීම, ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනීම හා යාවත්කාලීන කිරීම කළ යුතුය.

07. මෙහිදී ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන නිලධාරීන් ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සක්‍රීය අයුරින් සහභාගී කරගත යුතු අතර සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.

08. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටෙක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරීමටත්, යාවත්කාලීන කිරීමටත් කටයුතු කළ යුතු වේ. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 01 ට අනුව එළඹෙන මස 10 වන දිනට පෙර samurdhimarketing@gmail.com මගින් අධ්‍යක්ෂ - අලෙවි වෙත ලැබීමට සැලැස්විය යුතුය. පුහුණුව ලැබූ කාන්තාවන් පිළිබඳව තොරතුරු පුහුණු වැඩසටහන් අවසන් වූ වහාම ඇමුණුම 02 ට අනුව ලබා දීම.

09. සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම කෙරෙහි දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් නිරන්තර අවධානය යොමු කළ යුතු වේ.

ඉහත සියළු වැඩසටහන් සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු සියළු සමෘද්ධි නිලධාරීන්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර දුරකථන අංක 0112187547 මගින් හෝ samurdhimarketing@gmail.com යන විද්‍යුත් තැපැල මගින් අලෙවි අංශය වෙතින් ලබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ආර්. පී. බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:

| | | |
|---|---|---|
| 01. ලේකම් (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය) | - | කා.දැ.ගැ.පි. |
| 02. විගණකාධිපති | - | කා.දැ.ගැ.පි. |
| 03. ප්‍රධාන ගණකාධිකාරී (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | කා.දැ.ගැ.පි. හා අ.ක.ස. |
| 04. ප්‍රධාන අභ්‍යන්තර විගණක (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) | - | කා.දැ.ගැ.පි. හා අ.ක.ස. |
| 05. සියළුම අංශ ප්‍රධානීන් | - | කා.දැ.ගැ.පි. හා අ.ක.ස. |